# ජාතික පාසල් වල ඉගෙනුම ලබන කණිෂ්ඨ ද්විතීය මට්ටමේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන සාධනයට පවුල බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනයක්

(ගාල්ල අධ්‍යාපන කොට්ඨාශයේ පිහිටි ජාතික පාසල් ඇසුරින්)

එච්. ඩී. සරත්
**B. A, B. Ed, Dip. in Teaching (Merit)**
**Dip. in Ed. (Distinction)**
අධ්‍යාපනපති උපාධි අපේක්ෂක
ශිෂ්‍ය අංකය :- 59807724

REFERENCE ONLY

OPEN UNIVERSITY
65621

අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.

අධ්‍යාපන අධ්‍යයන අංශය,
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.
(2003)

65621

# සංක්ෂිප්තය

ජාතික පාසල් වල ඉගෙනුම ලබන කනිෂ්ඨ ද්විතීය මට්ටමේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන් සාධනයට පවුල බලපාන ආකාරය විමර්ශනාත්මකව අධ්‍යයනයට ලක් කරන ලද මෙම පර්යේෂණය තුළින් ජාතික පාසල් වල කනිෂ්ඨ ද්විතීය මට්ටමේ පන්තිවල ඉගෙනුම ලබන සිසුන්ගේ අධ්‍යාපන සාධනයට පවුල ආශ්‍රිත සාධක බලපාන ආකාරයන් පිළිබඳව විමසීමට ලක්කරන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණ තුළින් ශිෂ්‍ය අධ්‍යාපන සාධනයට බලපෑ හැකි පවුල ආශ්‍රිත සාධක කිහිපයක් කෙරෙහි පමණක් අවධානය යොමු කරන ලදී. මේ යටතේ පවුල සතු ආර්ථික ශක්තිය, දෙමාපියන් නියැලෙන රැකියාවේ ස්වභාවය, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, අධ්‍යාපනය පිළිබඳව දෙමාපියන් දරන ආකල්ප සහ අධ්‍යාපනයට දෙමාපියන් වෙතින් කෙරෙන දිරිගැන්වීම් හා පෙළඹවීම් යනාදී සාධක ශිෂ්‍ය අධ්‍යාපන සාධනයට බලපාන ආකාරයන් සොයා බලන ලදී..

විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි නම් ක්‍රමවේදය ඔස්සේ පර්යේෂණ දත්ත රැස් කෙරිණි. ගාල්ල අධ්‍යාපන කොට්ටාශයේ ජාතික පාසල් වල නව වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් අතුරින් 374 දෙනෙකුගෙන් යුතු නියැදියක් සරල අහඹු නියැදිකරණය ඔස්සේ තෝරා ගැනිනි. රැස් කර ගත් දත්ත සහ සම්බන්ධන සංගුනකය ගණනය කිරීම් තුළින් හා වගු, ප්‍රස්තාර ඇසුරු කොට විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදී.

පරීක්ෂාකරන ලද ස්වායක්ත විචල්‍යයන් අනුව තෝරාගත් නියැදිය විවිධ සමාජ ආර්ථික මට්ටම් නියෝජනය කරන බව දක්නට ලැබිනි. ඉහළ ආර්ථික මට්ටමක් සහිත පවුල් නියෝජනය කරන සිසුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බව මින් අනාවරණය වූ එක් කරුණකි. සමාජීය වශයෙන් ඉහළ වෘත්තීය ගරුත්වයක් හිමි රැකියාවල නියුතු දෙමාපියන්ගේ දරුවන් සාපේක්ෂව ඉහළ සාධන මට්ටමක් පෙන්වන බවද, මින් හෙළිදරව් විය. එසේම දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම හා දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සමීප සම්බන්ධතාවයක් පවතින බව විශ්ලේෂිත දත්ත ආශ්‍රිතව පෙනී යයි. තව ද, දෙමාපියන් වශයෙන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව ධනාත්මක ආකල්ප පැවතීම ද, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට නිවසේදී දෙමාපියන් කරනු ලබන දිරිගැන්වීම් හා පෙළඹවීම් ඉහළ මට්ටමක පවතීම ද, ශිෂ්‍ය අධ්‍යාපන සාධන මට්ටම ඉහළ යාමට හේතුවන බව මෙම පර්යේෂණය එළඹිය හැකි වූ තවත් නිගමනයකි.

එච්. ඩී. සරත්